# 01. පාලිභාසා

## පඨමො පාඨො



බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛ දේශනා ලියා ඇති පොත් හඳුන්වන්නේ ත්‍රිපිටකය නමිනි. ඒවා ලියා ඇත්තේ පාලි භාෂාවෙනි. භාෂාව ලියා දැක්වීම සඳහා අපට අකුරු අවශ්‍ය වේ. පාලි භාෂාවේ අකුරු හතළිස් එකක් (41) දක්නට ලැබේ. මතු දැක්වෙන එම අකුරු නිවැරැදි ව උච්චාරණය කරමින් කියවන්න.

# පාලි අක්ඛරමාලා

පාලි අක්ෂරමාලාවේ අකුරු 41, ස්වර (සරා) ව්‍යඤ්ජන (බ්‍යඤ්ජනා) යනුවෙන් කොටස් දෙකකට බෙදේ.

## ස්වර අටකි (8).

තනිව උච්චාරණය කළ හැකි අකුරු ස්වර නම් වේ.

අ ආ ඉ ඊ උ ඌ එ ඔ

## ව්‍යඤ්ජන තිස්තුනකි (33).

මෙහි ව්‍යඤ්ජන අක්ෂර හල් අකුරු ය. ස්වරයක් ආරූඪකර ඇත්තේ කියවීමේ පහසුව සඳහා ය.

| | | | | |
|---|---|---|---|---|
| ක | ඛ | ග | ඝ | ඞ |
| ච | ඡ | ජ | ඣ | ඤ |
| ට | ඨ | ඩ | ඪ | ණ |
| ත | ථ | ද | ධ | න |
| ප | ඵ | බ | භ | ම |
| ය | ර | ල | ව | |
| ස | හ | ළ | (අ) ං | |

- (අක්ඛරාපාදයො එකචත්තාළීසං)
- (තත්ථොදන්තා සරා අට්ඨ)
- (සෙසා බ්‍යඤ්ජනා)

## අභ්‍යාසය 01 1

1. පාලි හෝඩියේ අකුරු කීය ද?
2. පාලි හෝඩිය කොටස් කීයකට බෙදේ ද?
3. ස්වර අකුරු කීය ද?
4. ව්‍යඤ්ජන අකුරු කීය ද?
5. පහත දැක්වෙන ඡේදය පිටපත් කරන්න.

   එවං මෙ සුත්තං, එකං සමයං හගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන හගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා හගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා හගවන්තං ගාථාය අජ්ඣභාසි.

6. ඔබ විසින් පිටපත් කරන ලද ඡේදයේ තනි ව යෙදී ඇති ස්වර අකුරු යටින් ඉරක් අඳින්න.
7. පාලි අක්‍ෂරමාලාව නිවැරැදි ව ශබ්ද නගා උච්චාරණය කරන්න.
8. එම අකුරු ස්වර ව්‍යඤ්ජන වශයෙන් වෙන වෙන ම මතකයෙන් කියන්න.